# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 09 අන්තර්ජාතික වෙළෙඳාම
## බහුවරණ ප්‍රශ්න

අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර** තෝරන්න.

1. A රටට B රටට වඩා x භාණ්ඩය නිපදවීමේ නිරපේක්ෂ වාසියක් ඇති බව කියවේ. මින් අදහස් වන්නේ,
   (1) A රටට B රටට වඩා අඩු ආවස්ථික පිරිවැයකින් x භාණ්ඩය නිපදවිය හැකි බවයි.
   (2) A රටට B රටට වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් x භාණ්ඩය නිපදවිය හැකි බවයි.
   (3) A රටට B රටට වඩා x භාණ්ඩ වැඩියෙන් නිපදවිය හැකි බවයි.
   (4) B රටට A රටට වඩා x භාණ්ඩ වැඩියෙන් නිපදවිය හැකි බවයි.
   (5) A රට මෙන්ම B රට x භාණ්ඩ සම්බන්ධයෙන් ජාත්‍යන්තර වෙළෙඳාමට සහභාගී නොවන බවයි.

2. රටවල් දෙකක් පරිඝණක නිපදවීම හා යතුරුපැදි නිපදවීම සම්බන්ධයෙන් තොරතුරු පහත දැක්වේ. ( ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි නිමවුම් ඒකක ගණන සපයා ඇත.)

| භාණ්ඩය | A රට | B රට |
|---|---|---|
| පරිඝණක | 5 | 7 |
| යතුරුපැදි | 10 | 15 |

   සපයා ඇති ඉහත තොරතුරු අනුව ඔබට එකඟ විය හැකි ප්‍රකාශය තෝරන්න.
   (1) පරිඝණක නිපදවීමේ නිරපේක්ෂ වාසිය A රටට හිමිවේ.
   (2) යතුරුපැදි නිපදවීමේ නිරපේක්ෂ වාසිය B රටට හිමිවේ.
   (3) නිරපේක්ෂ වාසිය අනුව රටවල් අතර වෙළෙඳාමක් සිදුවේ.
   (4) පරිඝණක නිපදවීමේ සාපේක්ෂ වාසිය B රටට හිමිවේ.
   (5) යතුරුපැදි නිපදවීමේ සාපේක්ෂ වාසිය A රටට හිමිවේ.

3. අන්තර්ජාතික වෙළෙඳාමේදී සාපේක්ෂ වාසි හට නොගන්නා මූලාශ්‍රයක් වන්නේ, පහත කවර වෙනස්කම්ද?
   (1) සම්පත් සම්භාරයේ
   (2) තාක්ෂණික
   (3) පරිමාණානුකූල පිරිමැසුම්
   (4) අභිරුචියේ
   (5) සාධක සංචලතාවයේ

4. අන්තර්ජාතික වෙළෙඳාමේදී ගතික වාසිය හට ගනුයේ, පහත කවර කරුණක් මතද?
   (1) සම්පත් සම්භාරය
   (2) කාරක ප්‍රාග්ධනය සපයාගැනීමේ පහසුව
   (3) රටවල් විසින් නිර්මාණය කර ගනු ලබන තත්වයන්
   (4) ස්ථානගත වීම
   (5) පරිමාණානුකූල ඵල

5. සඵල ආරක්ෂණ අනුපාතය ඉහල අගයක් ගැනීමට හේතුවක් වනුයේ,
   (1) භාණ්ඩයේ වටිනාකම තුල ආනයනික යෙදවුම් ප්‍රතිශතය පහල අගයක් ගැනීමයි.
   (2) ආනයනික යෙදවුම් මත පනවනු ලබන තීරුබදු අනුපාතය ඉහළ අගයක් ගැනීමයි.
   (3) අවසන් නිෂ්පාදනය මත පනවනු ලබන නාමික තීරු බදු අනුපාතය පහල අගයක් ගැනීමයි.
   (4) සුඛසාධන භාණ්ඩ ආනයන දිරිමත් කිරීමයි.
   (5) රජය විසින් සියලුම තීරුබදු කපා හැරීමයි.

6. භාණ්ඩ වෙළෙඳ අනුපාතය අර්ථ දක්වනුයේ, පහත කවර කරුණක් ලෙසද?
   (1) අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තිය
   (2) ආනයන ඒකකයක අපනයන ක්‍රය ශක්තිය
   (3) අපනයන වල ආනයන ක්‍රය ශක්තිය
   (4) ආනයන වල අපනයන ක්‍රය ශක්තිය
   (5) රටවල් අතර භාණ්ඩ හුවමාරු කරන අනුපාතය

7. ආදායම් වෙළෙඳ අනුපාතය පහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාකයක් වනුයේ
   (1) උද්ධමනාත්මක බලපෑම් අඩුවීමයි.
   (2) වෙළෙඳ ශේෂය ඉහල යාමයි.
   (3) ගෙවුම් ශේෂය හිතකර තත්වයකට පැමිණීමයි.
   (4) ආනයන ශක්‍යතාවය ඉහළ යාමයි.
   (5) ආනයන වියදම පහල යාමයි.

8. ලෝක වෙළෙඳ සංවිධානයේ අරමුණු අතර ප්‍රධාන අරමුණ වන්නේ,
   (1) රටවල්වල ගෙවුම් ශේෂ අර්බුදවලදී සහාය වීමයි.
   (2) වරණීය වෙළෙඳ කලාප බිහි කිරීමයි.
   (3) වෙළෙඳාම නිසා ඇති වන පාරිසරික ගැටළු අවම කිරීමයි.
   (4) ද්වී පාර්ශ්වීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමයි.
   (5) බහු පාර්ශ්වීය වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමයි.

9. ආර්ථික ගෝලීයකරණය නිසා රටකට ලබාගත හැකි ආර්ථික වාසියක් වනුයේ
   (1) විදේශ ආයෝජන ඉහල යාමයි.
   (2) දේශීය ළදරු කර්මාන්ත බිඳ වැටීමයි.
   (3) ජාත්‍යන්තර වශයෙන් ආදායම් විෂමතා පුළුල් වීමයි.
   (4) මූල්‍ය වෙළෙඳපොල අස්ථායිතා හට ගැනීමයි.
   (5) විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය වීමයි.

10. අපනයන වෙළෙඳාමේදී ශ්‍රී ලංකාවට වැඩිම වැදගත්කමක් ලබා දෙන අපනයන කාණ්ඩය හා භාණ්ඩ වර්ගය වන්නේ ,
    (1) කෘෂි අපනයන හා තේ නිෂ්පාදනයයි.
    (2) කාර්මික අපනයන හා රබර් නිෂ්පාදනයයි.
    (3) කෘෂි අපනයන හා පොල් නිෂ්පාදනයයි.
    (4) කාර්මික අපනයන හා ඛණිජ තෙල් නිෂ්පාදනයයි.
    (5) කාර්මික අපනයන හා රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදනයයි.

11. ආනයන වෙළෙඳාමේදී ශ්‍රී ලංකාවට වැඩිම වැදගත්කමක් ඇති ආනයන කාණ්ඩය හා භාණ්ඩ වර්ගය වනුයේ,
    (1) අන්තර් භාණ්ඩ හා බොරතෙල්ය.
    (2) අන්තර් භාණ්ඩ හා රසායනික නිෂ්පාදනයයි.
    (3) අන්තර් භාණ්ඩ හා පොහොරයි.
    (4) ආයෝජන භාණ්ඩ හා මෝටර් වාහනයි.
    (5) පාරිභෝගික භාණ්ඩ හා ආහාර ද්‍රව්‍යයයි.

12. අපනයන වෙළෙඳාමේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ගැටළුවක් නොවනුයේ,
    (1) අපනයන වෙළෙඳපොලවල මන්දගාමී වර්ධනයයි.
    (2) ගෝලීය ආර්ථික අවපාත ඇති වීමයි.
    (3) ලෝක වෙළෙඳපොලේ දැඩි අවිනිශ්චිතභාවයයි.
    (4) අපනයන භෝග වල මිල උච්ඡාවචනයයි.
    (5) වර්තමානයේ අපනයන භාණ්ඩ කාණ්ඩය විවිධාංගීකරණය වී තිබීමයි.

13. ජාත්‍යන්තර වෙළෙඳාම ඔස්සේ රටකට ලබාගත හැකි වාසියක් වන්නේ,
    (1) නිෂ්පාදන හැකියා මායිමෙන් පිටත පරිභෝජනය කිරීමට හැකියාව ලැබීමය.
    (2) නිෂ්පාදන හැකියා මායිමෙන් පිටත නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබීමය.
    (3) නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුලත නිෂ්පාදනය කිරීමට හැකියාව ලැබීමය.
    (4) නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුලත පරිභෝජනය කිරීමට හැකියාව ලැබීමය.
    (5) නිෂ්පාදන හැකියා මායිමෙන් ඇතුලතත් පිටතත් පරිභෝජනය කිරීමට හැකියාව නොලැබීමය.

14. රටක වෙළෙඳ අනුපාතයේ පිරිහීමක් ඇති වීමට නිශ්චිතවම බලපෑ හැක්කේ
    (1) අපනයන මිල පහල වැටීමේදී ආනයන මිල පහල යාමය.
    (2) අපනයන මිල පහල වැටීමේදී ආනයන මිල ඉහල යාමය.
    (3) අපනයන මිල ස්ථාවරව තිබියදී ආනයන මිල පහල යාමය.
    (4) ආනයන මිල ස්ථාවරව තිබියදී අපනයන මිල ඉහල යාමය.
    (5) අපනයන මිල මෙන්ම ආනයන මිල ද ඉහල යාමය.


15. ශ්‍රී ලංකාවේ වර්තමානයේ වඩා වැදගත්ම ආනයන වෙළෙඳපොලවල් වන්නේ,
    (1) ඉන්දියාව හා මැදපෙරදිගයි.
    (2) ඉන්දියාව හා රුසියාවයි.
    (3) එක්සත් ජනපදය හා ඉන්දියාවයි.
    (4) චීනය හා එක්සත් ජනපදයයි.
    (5) ඉන්දියාව හා චීනයයි.

16. විදේශ වෙළෙඳාමේදී සාපේක්ෂ වාසිය යනුවෙන් හැඳින්වෙන්නේ රටකට තවත් රටකට සාපේක්ෂව,
   (1) වැඩි කාර්යක්ෂමතාවයකින් භාණ්ඩ නිපදවීමේ හැකියාවයි.
   (2) අඩු යෙදවුමකින් උපරිම නිමවුමක් ලබා ගැනීමේ හැකියාවයි.
   (3) උපරිම නිමවුමක් ලබා ගැනීමට අඩු යෙදවුම් ප්‍රමාණයක් භාවිත කිරීමේ හැකියාවයි.
   (4) ස්ථාවර ආවස්ථික පිරිවැයක් සහිතව නිපදවා ගැනීමේ හැකියාවයි.
   (5) අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීමේ හැකියාවයි.

17. එක්තරා රටක අපනයන මිල දර්ශකය 120 සිට 130 දක්වා වැඩි වන විට ආනයන මිල දර්ශකය 150 ලෙස ස්ථාවරව පැවතුනි.මේ හේතුවෙන් ආර්ථිකය තුල සිදු විය හැකි ප්‍රතිවිපාකයක් වනුයේ,
   (1) භාණ්ඩ වෙළෙඳ අනුපාතය අයහපත් විමයි.
   (2) වෙළෙඳශේෂ හිඟය වැඩි වීමයි.
   (3) භාණ්ඩ වෙළෙඳ අනුපාතය යහපත් වීමයි.
   (4) සංචිත හා වත්කම් අඩුවීමයි.
   (5) ආනයන ශක්‍යතාවය පහල යාමයි.

18. භාණ්ඩ වර්ග දෙකක් නිපදවීම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය එකම රටකට හිමිවී තිබේ නම් ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ පහත කුමන ප්‍රකාශය වඩා නිවැරදිවේද?
   (1) එක් රටක් පමණක් වෙළෙඳාමෙන් ඉවත් විය යුතුය.
   (2) රටවල් දෙකම වෙළෙඳාමෙන් ඉවත් විය යුතුය.
   (3) අන්‍යෝන්‍ය වශයෙන් වාසි සහගත වෙළෙඳාමකට පදනමක් බිහි නොවේ.
   (4) කිසිදු රටකට කිසිම ආකාරයකින් වෙළෙඳාමට දායක විය නොහැක.
   (5) කාල පමාවකින් පසුව ජාත්‍යන්තර වෙළෙඳාමට දායක විය යුතුය.

19. රටවල් දෙකක නිෂ්පාදන හැකියාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.




ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය වඩාත් නිවැරදිවේද?

   (1) A රටෙහි ආහාර නිපදවීමේ ආවස්ථික පිරිවැය 5කි.
   (2) B රටෙහි ආහාර නිපදවීමේ ආවස්ථික පිරිවැය 2කි.
   (3) ආහාර නිපදවීමේ සාපේක්ෂ වාසිය A රටට හිමිවේ.
   (4) රෙදි නිපදවීමේ සාපේක්ෂ වාසිය A රටට හිමිවේ.
   (5) රටවල් අතර කිසිදු වෙළෙඳාමක් සිදු නොවේ.

20. කිසියම් රටක් වෙළෙඳ ප්‍රතිපත්තියක් ලෙස ආරක්ෂණවාදී ප්‍රතිපත්ති අනුගමනය කරයි නම් ඊට විපක්ෂව පැන නගින තර්කයක් වනුයේ,

(1) ගෙවුම් ශේෂ දුෂ්කරතාවයට විසඳුමක්වීම.

(2) දේශීය සම්පත් උපයෝජනය ඉහළ යාම.

(3) ප්‍රපාතනය වලක්වා ගැනීමට උපකාරීවීම.

(4) ආර්ථික ස්ථායිතාවය ඇති කර ගැනීමට වැදගත්වීම.

(5) ගුණාත්මක බවින් ඉහල භාණ්ඩ නිෂ්පාදනය අඩු විය හැකිවීම.

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය

## 09 අන්තර්ජාතික වෙළෙඳාම

### බහුවරණ පිළිතුරු

| | |
|---|---|
| 1. | (2) |
| 2. | (2) |
| 3. | (5) |
| 4. | (3) |
| 5. | (1) |
| 6. | (1) |
| 7. | (1) |
| 8. | (5) |
| 9. | (1) |
| 10. | (5) |
| 11. | (1) |
| 12. | (1) |
| 13. | (1) |
| 14. | (2) |
| 15. | (5) |
| 16. | (5) |
| 17. | (3) |
| 18. | (3) |
| 19. | (3) |
| 20. | (5) |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 09 අන්තර්ජාතික වෙළෙඳාම
## ව්‍යුහගත ප්‍රශ්න

**සියළුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1.

(i) විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය හා සාපේක්ෂ වාසිය යනුවෙන් කුමක් අදහස් වේද?

(ii) කිසියම් රටක් ස්වයංපෝෂිත නොවී ජාත්‍යන්තර වෙළෙඳාමට සහභාගී වීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ කවරේද?

(iii) භාණ්ඩ වෙළෙඳ අනුපාතය යනු කුමක්ද? එය ගණනය කරන්නේ කෙසේද?

(iv) වෙළෙඳ ප්‍රතිපත්තියක් ලෙස නිදහස් වෙළෙඳාමට සාපේක්ෂව ආරක්ෂණවාදී ප්‍රතිපත්තියක දැකිය හැකි හිතකර ලක්ෂණ කවරේද?

(v) ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යුහය හා ආනයන ව්‍යුහය සකස් වී ඇත්තේ කෙසේද?

2.

(i) රටකට සාපේක්ෂ වාසි හට ගන්නා මූලාශ්‍ර කවරේද?

(ii) නිරපේක්ෂ වාසියක් නොමැති අවස්ථාවක පවා රටකට ජාත්‍යන්තර වෙළෙඳාමට සම්බන්ධ වීමට හැකියාව ඇත්තේ කෙසේද?

(iii) භාණ්ඩ වෙළෙඳ අනුපාතය සහ ආදායම් වෙළෙඳ අනුපාතය අතර ඇති වෙනස කුමක්ද?

(iv) ජාත්‍යන්තර වෙළෙඳාම දියුණු කිරීම සම්බන්ධයෙන් ලෝක වෙළෙඳ සංවිධානය (WHO) විසින් ඉටු කරනු ලබන්නේ කවර කාර්ය භාරයක්ද?

(v) නිදහස් වෙළෙඳාමට බාධා ඇති කිරීම සම්බන්ධයෙන් විපක්ෂව ඉදිරිපත් කරන තර්ක කවරේද?

3.

(i) ශ්‍රම ඒකකයක් භාවිතා කොට ඉන්දියාවට හා පාකිස්ථානයට නිපදවිය හැකි රෙදි සහ ආහාර ඒකක ප්‍රමාණයන් පහත වගුවේ පෙන්නුම් කරයි.

| රට / භාණ්ඩය | ඉන්දියාව | පාකිස්ථානය |
|---|---|---|
| රෙදි (මීටර) | 10 | 8 |
| ආහාර (කිලෝ ග්‍රෑම්) | 20 | 5 |

(අ) එක් එක් භාණ්ඩය නිපදවීම සම්බන්ධයෙන් නිරපේක්ෂ වාසිය ඇත්තේ කවර රටකටද?

(ආ) එක් එක් රටට සාපේක්ෂ වාසිය ඇත්තේ කුමන භාණ්ඩය සම්බන්ධයෙන්ද?

(ඉ) ඉහත රටවල් අතර විදේශ වෙළෙඳාමක් ආරම්භ වුවහොත් එක් එක් රට කුමන භාණ්ඩ අපනයනය කිරීමෙන් වෙළෙඳාමට දායක වේද?

(ii) ආරක්ෂණවාදී ක්‍රියා මාර්ගයක් ලෙස භාවිතා වන තීරුබදු නොවන බාධා කිරීම් 04ක් සඳහන් කරන්න.

(iii) වෙළෙඳ අනුපාතය හා වෙළෙඳ ශේෂය යනු එකම සංකල්පයකි. ඔබ මෙම ප්‍රකාශය හා එකඟ වන්නේද? පැහැදිලි කරන්න.

(iv) අන්තර් ජාතික වෙළෙඳාම තුළින් ආර්ථිකයකට අත්කර ගත හැකි වාසි සඳහන් කරන්න.

4.

(i) සංයුක්ත සම්පත් ඒකකයක් භාවිතා කර චීනය හා රුසියාව පරිගණක යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය සිදු කරන අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| භාණ්ඩය | චීනය | රුසියාව |
|---|---|---|
| පරිගණක | 10 | 05 |
| ගුවන් විදුලි යන්ත්‍ර | 30 | 12 |

(අ) ඉහත භාණ්ඩ නිපදවීමේදී එක් එක් භාණ්ඩය නිපදවීමේ නිරපේක්ෂ වාසි ඇත්තේ කුමන රටවලටද?

(ආ) ඉහත රටවල් අතර වෙළෙඳාමක් සිදු වේද? වෙළෙඳාම සිදු වන්නේ නම් රටවල් අතර කුමන භාණ්ඩ හුවමාරුවේද?

(ii) ශ්‍රී ලංකාව විසින් අපනයනය හා ආනයනය කරනු ලබන භාණ්ඩ අයිතම 04 බැගින් සඳහන් කරන්න.

(iii) ගෝලීය සංකල්පයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක කවරේද?

(iv) ජාත්‍යන්තර වෙළෙඳාමේදී විශේෂීකරණයේ වාසි හා තරඟකාරිත්වයේ වාසිය අතර වෙනස කුමක්ද?

5.

(i) පහත දැක්වෙන්නේ එක්සත් ජනපදය සහ කැනඩාව යන රටවලට පරිගණක යන්ත්‍ර හා ඖෂධ නිපදවීමට වැය වන ශ්‍රම ඒකක පිළිබඳ තොරතුරුය.

| භාණ්ඩය | එක්සත් ජනපදය | කැනඩාව |
|---|---|---|
| පරිගණක යන්ත්‍ර | 20 | 30 |
| ඖෂධ | 03 | 12 |

(අ) පරිගණක නිපදවීමේ නිරපේක්ෂ වාසිය ඇත්තේ කුමන රටටද?

(ආ) සාපේක්ෂ වාසි න්‍යායට අනුව රටවල් අතර විදේශ වෙළෙඳාම සිදු වන්නේ කෙසේද?

(ii) කිසියම් රටකට විදේශ වෙළෙඳාමේදී තරඟකාරීත්වයේ වාසි හට ගැනීමට බලපාන සාධක කවරේද?

(iii) ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය ඉතා පහත මට්ටමක පැවතීමට බලපා ඇති හේතු කවරේද?

(iv) රටක වෙළෙඳ අනුපාතය යහපත් වීමට බලපා ඇති හේතු කවරේද?

(v) වෙළෙඳ අනුපාතය පිරිහීමක ආර්ථික ප්‍රතිවිපාක කවරේද?

# ආර්ථික විද්‍යාව
# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
# සඳහා විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
# 09 අන්තර්ජාතික වෙළෙඳාම
## ව්‍යුහගත ප්‍රශ්න සඳහා පිළිතුරු

1.

(i) රටවල් දෙකක භාණ්ඩ නිෂ්පාදනය සන්සන්දනය කල විට එක් රටකට අනෙක් රටට සාපේක්ෂව වැඩිම කාර්යක්ෂමතාවයකින් භාණ්ඩ නිපදවීමට හැකි නම් එය නිරපේක්ෂ වාසියයි.

නිමවුමක් සඳහා අඩුම සම්පත් පිරිවැයක් භාවිතා කිරීමෙන් හෝ යෙදවුමකින් වැඩිම නිෂ්පාදනයක් ලබා ගැනීමෙන් නිරපේක්ෂ වාසි හට ගනී.

රටකට තවත් රටකට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් භාණ්ඩ නිපදවීමට ඇති හැකියාව සාපේක්ෂ වාසියයි.

(ii)

- දේශීය වශයෙන් නිපදවීමට නොහැකි භාණ්ඩ පරිභෝජනය කිරීමේ හැකියාව
- දියුණු තාක්ෂණය විදේශ රටවලින් ලබාගත හැකි වීම.
- අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීමට වෙළෙඳපොලවල් සොයා ගත හැකි වීම.
- සම්පත් කාර්යක්ෂමව භාවිතා කලහැකි වීම.
- ආර්ථික වර්ධනය වේගවත් වීම.
- වෙළෙඳාම දියුණු වීමෙන් අනෙකුත් උපකාරක සේවාවල දියුණුවක් ඇති වීම.

(iii) අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තියයි. නැතහොත් අපනයන කරන භාණ්ඩ ඒකකයකින් ආනයනය කල හැකි භාණ්ඩ ප්‍රමාණය දැක්වීමයි.

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$$

(iv)

- දේශීය ළදරු කර්මාන්ත විදේශ තරඟකාරිත්වයෙන් ආරක්ෂා කල හැකි වීම.
- දේශීය සම්පත් උපයෝජනය ඉහල යාම.
- ගෙවුම් ශේෂ දුෂ්කරතාවයන්ට පිළියමක් වීම.
- සේවා නියුක්තිය ආරක්ෂා වීම.
- ජාතික ආරක්ෂාව ශක්තිමත් වීම.
- අවගුණ භාණ්ඩ ආනයනය වැලකීම.

**(v) ආනයන ව්‍යුහය**

පාරිභෝගික භාණ්ඩ ආනයනය
අන්තර් භාණ්ඩ ආනයනය
ආයෝජන භාණ්ඩ ආනයනය
වර්ග නොකල භාණ්ඩ ආනයනය

**අපනයන ව්‍යුහය**

කෘෂි කාර්මික භාණ්ඩ අපනයනය
කාර්මික භාණ්ඩ අපනයනය
ඛණිජ ද්‍රව්‍ය අපනයනය
වර්ග නොකල අපනයනය

2.

(i) - සම්පත් සම්භාරයේ වෙනස්කම්
- ගුණාත්මක තත්වයන්
- නිෂ්පාදන ප්‍රභේදනය
- තාක්ෂණික වෙනස්කම්
- පරිමාණානුකූල පිරිමැසුම්
- අභිරුචියේ වෙනස්කම්
- රාජ්‍ය ප්‍රතිපත්ති
- ස්ථානගතවීම.

(ii) භාණ්ඩ නිපදවීම සම්බන්ධයෙන් කිසිම රටකට නිරපේක්ෂ වාසි නොමැති අවස්ථාවක පවා විදේශ වෙළෙඳාමට සහභාගී විය හැක.

නිරපේක්ෂ වාසි නොමැති වුවත් භාණ්ඩ නිපදවීමේදී පවතින ආවස්ථික පිරිවැය තත්වය පදනම්කර ගෙන විදේශ වෙළෙඳාමට සහභාගී විය හැක.

ඒ අනුව යම් භාණ්ඩයක් නිපදවීමට අනෙක් රටට සාපේක්ෂව අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවිය හැකි නම් එම රටට සාපේක්ෂ වාසියක් පවතී.

ඒ අනුව අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවිය හැකි භාණ්ඩය අපනයනය කිරීමෙනුත් වැඩි ආවස්ථික පිරිවැයක් ඇති භාණ්ඩ ආනයනය කිරීමෙනුත් විදේශ වෙළෙඳාමට දායක විය හැක.

(iii) - භාණ්ඩ වෙළෙඳ අනුපාතය යනු අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තියයි.

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$$

-ආදායම් වෙළෙඳ අනුපාතය යනු අපනයන ආදායමෙහි ආනයන ක්‍රය ශක්තියයි.

$$\text{භාණ්ඩ වෙළෙඳ අනුපාතය} = \frac{\text{අපනයන මිල දර්ශකය} X \text{අපනයන පරිමා දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$$

(iv) - ලෝක වෙළෙඳ ගිවිසුම් නිසි ලෙස ක්‍රියාත්මක වේද යන්න පරිපාලනය කිරීම.
-වෙළෙඳපොල ආරවුල් බේරුම් කිරීම.
-සාමාජික රටවල ප්‍රතිපත්ති සමාලෝචන කිරීම.
-ජාත්‍යන්තර ආර්ථික සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
-වෙළෙඳාම ප්‍රවර්ධනයට.

(v) -දේශීය හා විදේශීය වෙළෙඳපොල සංකෝචනය වීම.
-දියුණු තාක්ෂණය සංක්‍රමණයට බාධා ඇති වීම.
-ගුණාත්මක බවින් අඩු භාණ්ඩ නිෂ්පාදනයට පෙළඹුම් ඇතිවීම.
-වෙළෙඳාම සංකෝචනය වීමෙන් ජාතික ආදායම අඩු වීම.

3.

(i) (අ) රෙදි - ඉන්දියාව
ආහාර - ඉන්දියාව

**(ආ)රෙදි නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ඉන්දියාව $= \frac{20}{10} = 2$ පාකිස්ථානය $= \frac{5}{8} = 0.62$

**ආහාර නිපදවීමේ ආවස්ථික පිරිවැය**

ඉන්දියාව $= \frac{10}{20} = 0.5$ පාකිස්ථානය $= \frac{8}{5} = 1.6$

ඒ අනුව රෙදි නිපදවීමේ සාපේක්ෂ වාසිය - පාකිස්ථානය
ආහාර නිපදවීමේ සාපේක්ෂ වාසිය - ඉන්දියාව

(ඉ) ඉන්දියාව ආහාර නිපදවා අපනයනය කරයි.

පාකිස්ථානය රෙදි නිපදවා අපනයනය කරයි.

(ii) - සලාක හෙවත් කෝටා නියම කිරීම.
-දේශීය නිෂ්පාදනයන්ට සහනාධාර ලබා දීම.
-විදේශ විනිමය පාලනය
-වෙළෙඳ සම්බාධක පැනවීම.
-ප්‍රපාතනය
-පරිපාලන හා තාක්ෂණික ප්‍රමිතීන් නියම කිරීම.

(iii) එකඟ නොවේ.

භාණ්ඩ වෙළෙඳ අනුපාතය $= \frac{\text{අපනයන මිල දර්ශකය}}{\text{ආනයන මිල දර්ශකය}} X100$

භාණ්ඩ වෙළෙඳ අනුපාතය යනු අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තියයි.

නමුත් වෙළෙඳ ශේෂය යනු භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන ආදායම හා ආනයන වියදම අතර වෙනසයි.

වෙළෙඳ ශේෂය = අපනයන ආදායම - ආනයනික වියදම

(iv) - නිෂ්පාදන හැකියා මායිමට පිටතින් ඇති භාණ්ඩ සංයෝගයක් පරිභෝජනය කිරීමේ හැකියාව.
-විදේශ රටවල දියුණු තාක්ෂණය ලබා ගැනීමේ හැකියාව
-අතිරික්ත නිෂ්පාදන අලෙවි කිරීමට වෙළෙඳපොලක් හිමි වීම.
-සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමේ හැකියාව
-ආර්ථික වර්ධනය වේගවත් වීම.

4.

(i) (අ) පරිඝණක - චීනය

ගුවන් විදුලි යන්ත්‍රය - චීනය

(ආ) වෙළෙඳාමක් සිදුවේ. සාපේක්ෂ වාසිය මත වෙළෙඳාම සිදුවේ.

පරිඝණක නිපදවීමේ ආවස්ථික පිරිවැය

චීනය $= \frac{30}{10} = 3$

රුසියාව $= \frac{12}{50} = 2.4$

ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමේ ආවස්ථික පිරිවැය

චීනය $= \frac{10}{30} = 0.33$

රුසියාව $= \frac{5}{12} = 0.41$

පරසඝණක න්පදව්මේ සාපේක්ෂ වාස්ය - රුසියාව

ගුවන් විදුලි යන්ත්‍ර නිපදවීමේ සාපේක්ෂ වාසිය -චීනයට හිමිවේ.

ඒ අනුව රුසියාව පරිඝණක අපනයනය කිරීමෙනුත් චීනය ගුවන් විදුලි යන්ත්‍ර අපනයනය කිරීමෙනුත් වෙළෙඳාමට දායකවේ.

(ii) අපනයනය - තේ
- ඇඟළුම්
- රබර් නිෂ්පාදනය
- සම්භාණ්ඩ
- ආහාරපාන දුම්කොල

ආනයන - ආහාර
- පොහොර
- රසායනික ද්‍රව්‍ය
- වාහන
- බොරතෙල්

(iii)

1) නව රැකියා අවස්ථා බිහි වීම.
2) විදේශ ආයෝජන ඉහල යාම.
3) ලෝක වෙළෙඳ පරිමාව ඉහල යාම.
4) විදේශ සේවා නියුක්තිය ඉහල යාම.
5) නිෂ්පාදනය හා පරිභෝජනය ඉහල යාම.
6) තරඟකාරිත්වය තුලින් ගුණාත්මක නිෂ්පාදන බිහි වීම.
7) නව තාක්ෂණය ප්‍රසාරණය වීම.

(iv)

- තරඟකාරිත්වයේ වාසිය යනු කිසියම් භාණ්ඩයක් පාරිභෝගිකයන් වෙත සැපයීමේදී සෙසු තරඟකරුවන්ට වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන් වෙත ලබා දීමයි.
- තරඟකරුවන්ට වඩා අඩු මිලක් යටතේ අලෙවි කිරීමෙන් හෝ වැඩි ගුණාත්මක භාණ්ඩ ඉදිරිපත් කිරීමෙන් තරඟකාරිත්ව වාසිය ලබා ගත හැක.

- විශේෂීකරණයේ වාසිය යනු සාපේක්ෂ හෝ නිරපේක්ෂ වාසිය ඇති භාණ්ඩ විශේෂීකරණය වීමෙන් නිපදවා අලෙවි කිරීමෙන් එක් එක් රටේ නිෂ්පාදනය මෙන්ම ලෝක නිෂ්පාදනයද වර්ධනය වීමයි.

5.

(i) (අ) එක්සත් ජනපදය

(ආ)පරිඝණක වල ආවස්ථික පිරිවැය

එක්සත් ජනපදය= $\frac{20}{3} = 3.66$

කැනඩාව = $\frac{30}{10} = 3$

ඖෂධ වල ආවස්ථික පිරිවැය

එක්සත් ජනපදය = $\frac{3}{20} = 0.15$

කැනඩාව= $\frac{12}{30} = 0.4$

ඒ අනුව පරිඝණක නිපදවීමේ සාපේක්ෂ වාසිය කැනඩාවට හිමිවේ.
ඖෂධ නිපදවීමේ සාපේක්ෂ වාසිය එක්සත් ජනපදයට හිමිවේ.
ඒ අනුව කැනඩාව පරිඝණක අපනයනය කරයි.
එක්සත් ජනපදය ඖෂධ අපනයනය කරයි.

(ii)

- බුද්ධිමය දේපල හිමිකාරත්වය
- ප්‍රාග්ධන උපකරණ හිමිකාරත්වය
- නව්‍යතා හඳුන්වා දීමේ හැකියාව
- අඩු පිරිවැයක් සහිතව භාණ්ඩ නිපදවීමේ හැකියාව
- ඉතා විශාල නිෂ්පාදන ධාරිතාවක් තිබීම.
- බෙදා හැරීමේ ජාල පිළිබඳ සුවිශේෂ හිමිකමක් තිබීම.

(iii)කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමේ පහසුව

- අපනයන වෙළෙඳපොල විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම.
- අපනයන භාණ්ඩ විවිධාංගීකරණය ප්‍රමාණවත් නොවීම.
- අපනයන භාණ්ඩ වල මිල නිතර උච්ඡාවචනය වීම.
- ගෝලීයකරණයේ වාසි අත්කර නොගැනීම.
- ගෝලීය ආර්ථික අවපාත
- ලෝක වෙළෙඳපොලේ පවතින දැඩි අවිනිශ්චිතභාවය

(iv)

- අපනයන මිල දර්ශකය ඉහල යාම හා ආනයන මිල දර්ශකය පහල යාම.
- අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ආනයන මිල දර්ශකය පහල යාම.
- ආනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් අපනයන මිල දර්ශකය ඉහල යාම.
- අපනයන මිල දර්ශකය ස්ථාවරව තිබියදී ආනයන මිල දර්ශකය පහල යාම.
- ආනයන මිල දර්ශකයේ ස්ථාවරව තිබියදී අපනයන මිල දර්ශකය ඉහල යාම.

(v)

- ආනයන ශක්‍යතාවය පහල යාම.
- වෙළෙඳ ශේෂ හිඟය වැඩිවීම.
- ගෙවුම් ශේෂයේ සමස්ථ හිඟය වැඩි වීම.
- සංචිත හා වත්කම් අඩු වීම.